Department of Education,Sabaragamuwa Province/ Weekly School



Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

## ස්ටැන්ලි අබේසිංහ ශිල්පියා

- ශිල්පියාගේ නිර්මාණ හඳුනා ගනියි.
- ශිල්පියාට ලැබුණු ආභාසය විස්තර කරයි
- මොහුගේ සිතුවම් වල කලා ලක්ෂණ රස විඳියි

**ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්**

- පහත පින්තූර හොඳින් අධ්‍යයනය කරන්න
- ශිල්පීය උපක්‍රමහා එහි කරුණු පිළිබඳ හොඳින් අවධානය යොමු කරන්න.
- අවශ්‍ය කරුණු තම සටහන් පොතෙහි සටහන් කර ගන්න.
- අදාල ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**ස්ටැන්ලි අබේසිංහ මහතා**

20 වන සියවසේ නූතන කලා ඉතිහාසයේ මුල් කාලීනව බිහි වූ ප්‍රතිභාපූර්ණ චිත්‍ර ශිල්පියෙකි.

43 කණ්ඩායමේ නූතනවාදී ප්‍රකාශනයට සමගාමීව ලලිතකලා ආයතනයේ පුරෝගාමියෙකි.

කෙටි ඝන රේඛා භාවිතය හා ප්‍රකාශනවාදී චිත්‍ර කලා ප්‍රවනතාව වර්ණ භාවිතා කර ඇත.

කුඹල් හල, ඇසල පෙරහැර වැනි චිත්‍ර ඇඳ ඇත.



I. ශිල්පියා - ස්ටැන්ලි අබේසිංහ මහතා
II. තේමාව - මැටි භාජන විකුණුම් හලක් හා යුවලක් නිරූපිතය.

III. සුවිශේෂී ලක්ෂණ -

a. අඳුර හා ආලෝකය වර්ණ විසංගතව යොදා මිනිස් හැඟීම් වඩා තීව්‍ර ලෙස පෙන්වා ඇත

b. ප්‍රාණවත් කෙටි ඝනකමින් යුත් රේඛා භාවිතා ඇත.

c. මුහුණේ හැඟීම් ප්‍රකාශනයසඳහා අඳුරු වර්ණ නිර්මාණයේ භාවප්‍රකාශනය දක්වා ඇත.

d. විසංගත වර්ණ භාවිතා කර ඇත.



I. ශිල්පියා - ස්ටැන්ලි අබේසිංහ මහතා

II. වස්තු විෂය - මහ නුවර ඇසල පෙරහැර

III. සිතුවමේ නම - පෙරහැර

IV. හැඟීම් ප්‍රකාශනය -

a. අඳුර හා ආලෝකය වර්ණ සාර්තකව යොදා ගනිමින් රාත්‍රී කාලය ඉතා මැනවින් නිරූපනය කර ඇත.

b. පෙරහැරේ උත්සවශ්‍රීය විස්තරාත්මකව යොදා ඇත.

c. පෙරබිම පසුබිම හා මැද බිම ඉතා හොඳින් නිරූපනය කර ඇත.

**ඉහත පාඩම හා රූප සටහන් හොඳින් අධ්‍යයනය කර පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**

1. ස්ටැන්ලි අබේසිංහ මහතාගේ නිර්මාණ පිළිබඳ ඇගයීමක් සිදු කරන්න.
2. ඔහුගේ නිර්මාණ දෙකක් නම් කරන්න.
3. ඔහුගේ නිර්මාණ වල සුවිශේෂී ලක්ෂණ 5ක් සඳහන් කරන්න.

https://www.youtube.com/watch?v=G2pPbZOBSpY

ඉගෙනුම් ආධාරක https://www.youtube.com/watch?v=HZQRii2InpU

R. D. S විජේසුන්දර මිය

කෑ/බමුණුගම මලියදේව විද්‍යාලය